“කොවිඩ් 19 අභියෝග හමුවේ නොසැලෙන තර්ස්ටන් අපි”

ක්‍රියාකාරකම් අත්වැල

# 10 ශ්‍රේණිය - සිංහල

තර්ස්ටන් විද්‍යාලය

කොළඹ 07

# <u>Covid 19 අභියෝග මැද නොසැලෙන තර්ස්ටන් අපි</u>
# <u>විෂයානුබද්ධ ක්‍රියාකාරකම් අත්වැල</u>

**අදහස, මග පෙන්වීම හා අධීක්ෂණය -** විදුහල්පති ප්‍රමුදිත වික්‍රමසිංහ මයා

**සැලසුම් ක්‍රියාත්මක කිරීම -** නි.වි. අධ්‍යාපන සංවර්ධන එන්.ජී.එච්. සමන්තිනී මිය

6-13 සහකාර විදුහල්පති එම්.සී. ජයසේකර මයා

10 ශ්‍රේණි ප්‍රධාන ජී.ඩබ්.ඩී.එස්. වෙලගෙදර මයා

<u>ක්‍රියාකාරකම් පොත් සැකසීම</u>

- 6 ශ්‍රේණිය(සිංහල ) - ජයමිණී පෙරේරා මිය
  මධූකා සත්සරණී මෙවි
- 7 ශ්‍රේණිය(සිංහල ) - ඉසුරි උපේඛා මෙවි
  හශිකා ජයසූරිය මෙවි
- 8 ශ්‍රේණිය(සිංහල ) - සුගන්දි පියුමගේ මිය
- 9 ශ්‍රේණිය(සිංහල ) - සුලෝචනා දිසානායක මිය
- 10 ශ්‍රේණිය(සිංහල ) - පූජ්‍ය අලවතුගොඩ ධම්මින්ද හිමි
  අයන්ති පෙරේරා මිය
- 11 ශ්‍රේණිය (සිංහල ) - ජීවනී ධර්මරත්න මිය
  ප්‍රියන්ත විජයසිරි මයා
  උපේඛා සිරිකුමාරි මිය

# සිංහල භාෂාව

## 10 ශ්‍රේණිය

I වාරය

**ක්‍රියාකාරකම් අත්පොත**

# කාර්ය පත්‍රිකා අංක 01

**සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. දීර්ඝ ස්වර 04 ක් ලියා දක්වන්න.
2. අර්ධ ස්වර නම් කරන්න.
3. පිල්ලමකින් සංකේතවත් නොවන ස්වර අක්ෂරය කුමක්ද?
4. 'ෆ' අක්ෂරය යෙදුණු වචන 2 ක් ලියන්න.
5. ඌෂ්මාක්ෂර යනු මොනවාද? එම අක්ෂර හැඳින්වීමට එම නම යොදා ඇත්තේ කුමක් නිසා ද?
6. සිංහල අක්ෂරමාලාවේ ඇතත් වර්තමානයේ භාවිත නොවන අක්ෂර දෙකක් ලියන්න.
7. අක්ෂරමාලාවේ ඇති බැඳි අකුරු සේ පෙනුණ ද තනි ශබ්ද ලෙස එන අක්ෂර රූප දෙක ලියන්න.
8. විසර්ගය යෙදුණු වචන 2 ලියන්න.
9. අනුස්වාරය යෙදුණු වචන 2 ලියන්න.
10. බහුලව භාවිත වන සඤ්ඤක අක්ෂර හතර ලියා එම අක්ෂර සහිත වචන දෙක බැගින් ලියන්න.
11. අක්ෂර උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ග කීයක් හඳුනාගත හැකි ද? එම වර්ග නම් කරන්න.
12. ඉහත නම් කළ අක්ෂර වර්ගයන්ට අයත් අක්ෂර දෙක බැගින් ලියන්න.

# කාර්ය පත්‍රිකා අංක 02

* පහත දැක්වෙන ප්‍රාදේශික ව්‍යවහාරවල පොදු වහර ලියන්න.

| | | |
|---|---|---|
| 1 බලව්වා | 2 පුන්නච්චා | 3 මුවා වීලා |
| 4 බීජ | 5 යාකොය් | 6 කුදහන්නැතුව |
| 7 නැටිටං | 8 කොහා | 9 ඕයනවා |
| 10 සකලයා | 11' කුඩප්පා | 12 බුන්නා |
| 13 දැවා | 14 හිතව්වා | 15දොරං |
| 16 වැටං | 17 බත්තම්මා | 18 හිට්ටා |
| 19 පුතා දූ | 20 ගහමච්චා | |

# කාර්ය පත්‍රිකා අංක 03

* පහත දැක්වෙන නාම පද වල ප්‍රකෘති වෙන් කරන්න.

| | | |
|---|---|---|
| 1. දෙවියා | 2. කොටියෝ | 3. හිඟන්නා |
| 4. පුටුව | 5. කුල්ල | 6. ළමයි |
| 7. නපුර | 8. පොත | 9. මල්ල |
| 10. රාක්ෂයා | 11. රිලව් | 12. ගංගාව |
| 13. භික්ෂුව | 14. පැන්සල | 15. තිරිසනා |

# කාර්ය පත්‍රිකා අංක 04

* පහත වාක්‍යවල ඉරි ඇඳි පද කුමන ක්‍රියා වර්ගයට අයත්දැයි ලියන්න.

1. උපාසිකාව මල් කඩා බුදුන් වැන්දාය.
2. තාත්තා සේවකයන් ලවා වැඩ කරවයි.
3. දැරියෝ කවි කියමින් සතුටු වූහ.
4. දරුවනි, යහපතෙහි හැසිරෙන්න.
5. අපරාධකරුවන්ට දේව සාපය ලැබේවා!
6. වැසි වසිද්දී අකුණු පසන්නට විය.
7. තරුණයෙනි, රටේ සංවර්ධනයට උර දෙනු.
8. පාඩම් කළොත් විභාගය සමත් විය හැක.
9. ඔබට තිසරණ සරණ ලැබේවා!
10. වෛද්‍යවරයා රෝපියා පරීක්ෂා කොට බෙහෙත් ලබා දුන්නේය.

# කාර්ය පත්‍රිකා අංක 05

* පහත ක්‍රියා පදවල ධාතු ප්‍රකෘතිය වෙන් කර දක්වන්න.

| | | |
|---|---|---|
| 1. කියවයි | 2. නෙළති | 3. සාදයි |
| 4. කළේය | 5. පිපුණි | 6. බබළති |
| 7. නැටුවාය | 8. කියූහ | 9. බැලුවාය |
| 10. ඕියයි | 11. පැයුවාය | 12. කොටයි |

# කාර්ය පත්‍රිකා අංක 06

පහත දී ඇති රූඪී පදවල අර්ථය නිවැරදිව දක්වෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

| | |
|---|---|
| 1. වහ කඳුරු වගේ | 2. අකුල් හෙළනවා |
| 3. හරි හතරැස් විදිහට | 4. අර අදිනවා |
| 5. සීරුමාරුවට | 6. හාංකවිස්සියක්වත් |
| 7. ඉර හඳ දුටු මිනිස්සු | 8. කිඹුල් කඳුළු |
| 9. ඇඟිලි ගහනවා | 10. නිකමා |

(අංග සම්පූර්ණ, බොරුවට ඇඬීම, වැඩක් නැති කෙනෙක්, ඉතා අකමැති, කිසිම දෙයක්, බාධා කිරීම, සූදානම් වීම, බොහෝ අත්දැකීම් ඇති, අනවශ්‍ය ඬෙස මැදිහත් වන, පරිස්සමට)

# කාර්ය පත්‍රිකා අංක 07

* 'අ' කොටසේ දැක්වෙන ප්‍රස්තාවපිරුළු සම්පූර්ණ කිරීමට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1. අන්ධයාට | ලෙඩ හැදෙනවලු |
| 2. කිරියෙන් කාලා | සම්මාදම් වට්ටියට දාන්න වගේ |
| 3. ජීවකයාටත් | මීය වගේ |
| 4. තිසා වැවේ | ඇතාගේ හැටි කිව්වා වගේ |
| 5. අලි ගිය අඩිපාර | අල්ල ගත්තා වගේ |
| 6. පොට්ට සල්ලි | රහස වගෙ |
| 7. බලු වලිගෙ බැන්ද | බලන්න කන්නාඩි ඕනෙද? |
| 8. කුනිස්සන්ට | පැණියෙන් අත සෝදන්න වගේ |
| 9. රෙදි නැන්දට කියූ | සොරොව්ව ඇරියා වගේ |
| 10. කොටි වලිගේ | දැල් දැම්මා වගේ |

# කාර්ය පත්‍රිකා අංක 08

* පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| 1. හාවක් | 2. පැල | 3. අල්ලාප |
| 4. ඉමක් | 5. අත | 6. රැවුම් |
| 7. හුරු | 8. ඉහින් | 9. තාන්න |
| 10. අතුරු | 11. ආත | 12. කසු |

# කාර්ය පත්‍රිකා අංක 09

පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුහුඹුවන් පිළිබඳ තොරතුරු ඇමරිකා හාවඩ් විශ්වවිද්‍යාඩියෙන් හෙළි කරයි. ලෝකයේම සිටින උරග හා සිව්පා සතුන් එකට එක් කළත් කුහුඹුවන්ගේ සංඛ්‍යාව ඊට ඉහළ අගයක් පනී. මේ වන විට එකිනෙකාට වෙනස් වූ කුහුඹු වර්ග 800 කට වඩා ඇති බව කියවේ. කුහුඹු රාජ්‍යයේ සිටින අය නිරාහාරව සිටින විට හැමෝම එක සමානව නිරාහාරව වෙසෙති. ආහාර ගනිද්දී එක සමානව ආහාර ගන්නා අතර වමාරා දීමෙන් ආහාර බෙදී යාම එකම ප්‍රමාණයට පවත්වාගෙන යාම සිදු කරයි. කුහුඹුවකුගේ මොළයේ ස්නායු සෛල කෝටි දස ලක්ෂයක් ඇත. රංචුවක එක් රැජිනක්, පිරිමි කුහුඹු කිහිප දෙනෙක්, වැඩකරුවන් විශාල සංඛ්‍යාවක් වාසය කරති. අත්තටු ලබන කුහුඹුවෝ ඉගිලී යාම සිදු කරති. උ ගඳ දැනගන්නේ හිසෙහි ඇති කෙඳි දෙකෙන් ස්පර්ශ කිරීමෙනි.

1. කුහුඹුවන්ගේ සංඛ්‍යාව ඉතා විශාල බව මෙහි දක්වා ඇත්තේ කෙසේද?
2. ඔවුන් ආහාර ගනු ලබන්නේ කුමන ආකාරයකින්ද?
3. කුහුඹු රංචුවක සාමාජිකයන් සැකසී ඇත්තේ කුමන ආකාරයකටද?
4. කුහුඹුවාගේ හිසේ ඇති කෙඳි දෙක උපකාර වන්නේ කුමක් සඳහා ද?
5. විරුද්ධාර්ථ පද ලියන්න.

i. සමාන ii. පඳ iii. නිරාහාර iv. ස්පර්ශ

# කාර්ය පත්‍රිකා අංක 10

පහත දැක්වෙන විස්තර ඇසුරු කරගෙන වචන 250 කට නොඅඩු රචනා ලියන්න.

1. වර්තමානයේ සිදුවන විවිධ ස්වභාවික විපත් පිළිබඳව බොහෝ දෙනාගේ අවධානය යොමු වී තිබේ. මේවාට හේතු බොහොමයකි. මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිවන හානිය බොහෝ විට ස්වභාවික විපත්වලට ද හේතු වනු ඇත. මිනිසා විසින් පරිසරයට කරනු ලබන අහිතකර ක්‍රියා අවම කරමින් ස්වභාවික විපත් අවම කර ගැනීමට දායක වීම අප කාගේත් යුතුකමකි.

2. එදිනෙදා ජන ජීවිතයේ විවිධ අවස්ථාවන්වග දී ගැමියාපේ මුවට ගලා ආ නිදහස් සිතුවිලි මගින් ඔවුන්ගේ ජීවිතයේ තොරතුරු විසිතුරු අන්දමින් විවරණය විය. දුක, සතුට, කාංසිය, විඩාව, ආදරය, විරහව ආදී වූ විවිධාකාර චිත්තවේගයන් ඔවුන් මුදා හැරියේ ඉතා සංයමයෙන් යුක්තවය. එසේ බිහි වූ සංස්කෘතික අංගයක් වූ ජන කවිය තුළ ජන ජීවිතය මැනවින් චිත්‍රණය වන්නේ එබැවිනී

# කාර්ය පත්‍රිකා අංක 11

* පහත දී ඇති විස්තරය උපයෝගී කර ගනිමින් රාජකාරි ලිපියක් සකස් කරන්න.

1. රුහුණු කන්ද ගම හරහා ගලා යන ආඳා ඔය හරහා ඉදිකර තිබූ පැරණි ලී පාලම ඉතා අබලන් තත්වයේ පවතින බැවින් ගමේ යොවුන් සමාජයේ සාමාජික සාමාජිකාවන් නව පාලමක් ඉදි කිරීමට බලාපොරොත්තුවෙන් සිටිති. තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කර ඇති ''ගමට සවියක්'' වැඩසටහන යටතේ ලබා දෙන මුදල් ප්‍රතිපාදන ලබාගෙන එම පාලම සකස් කිරීම ඔවුන්ගේ අරමුණයි. එම ප්‍රතිපාදන ලබා ගැනීමට ඉල්ලුම් කිරීමට තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට යවන ලිපිය සකස් කරන්න. ඔබ යොවුන් සමාජයේ ලේකම් අනුපමා දිසානායක යැයි සිතන්න.

# කාර්ය පත්‍රිකා අංක 12

පහත දැක්වෙන ඡේදය වචන 45-50 අතර වචන සංඛ්‍යාවකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අවසානයේ ලියා දක්වන්න.

මානව සන්නිවේදනය මානව ශිෂ්ටාචාරය තරමටම පැරණිය. සන්නිවේදනයෙන් තොරව කවර සමාජ සංවිධානයක් වුව ද පවත්වාගෙන යෑම දුෂ්කර කාර්යයක් වන බැවිනි. නවීන විද්‍යාවේ දියුණුවත් සමග යන්ත්‍ර සූත්‍රාදිය සුලබ වීමත් සමග සන්නිවේදන කාර්යය සඳහා ජන මාධ්‍ය උපයෝජී කරගනු ලැබිණි. ප්‍රවෘත්ති පත්‍ර, ගුවන්විදුලිය, චිත්‍රපටිය, රූපවාහිනිය වැනි ජසන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රභවය හා ව්‍යාප්තිය සලකා බැලමේදී මෙය වටහාපත හැකිය.

මිනිසාට සිය පසිඳුරන්ගේ ක්‍රියාකාරීත්වය පෘථුල කිරීමටත්, තමා භාවිත කරන සංකේත සංඛ්‍යාව දෙගුණ තෙගුණ කිරීමටත් මෙම මාධ්‍ය බෙහෙවින් උපකාරී වේ. මුලදී පුද්ගලයන් විසින් ඉටු කරන ගද කර්තව්‍යයන් මුද්‍රිත්පත් කර ගැනීමට මෙම නවීන ජනමාධ්‍ය කේන්ද්‍ර කොට පත් විවිධ සමාජ ආයතන පැනනැගිණි. එතෙකුදු වුව මෙම සමාජ ආයතන පුද්ගලාන්තර සන්නිවේදනය ඉවත් කිරීමට සමත් වී නැත. ඒවා පුද්ගලාන්තර සන්නිවේදනය වඩාත් තහවුරු කොට ඒවා විස්තාරණය කළා පමණි. ප්‍රාකෘතික සමාජවල පැරණි මිනිසා ස්වභාව ධර්මයා සමග බිහිසුණු සටනක යෙදී සිටින අවධියේ දී ආහාරය සඳහා ගනු ලබන සතුන් හෝ තමන් යටපත් කිරීමට පැමිණෙන සතුරන් ගැන හෝ පරීක්ෂාවෙන් සිට ඒ බව සමාජයේ සෙස්සන්ට කල් තියා දැන්වීම පිණිස කිසියම් පුද්ගලයෙක් රඳවන ලදී. මෙම කාර්යය වර්තමාන සමාජයේ දී ද දක්නට ලැබේ. එකම වෙනස කඳු ගැටයක රඳවනු ලබන මිනිසෙකු වෙනුවට ප්‍රවෘත්ති පත්‍ර, ගුවන්විදුලිය බඳු පව් ෘත්ති මාධ්‍ය මගින් මෙම කටයුත්ත ඉටු වීමයි.

**********

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 10 ශ්‍රේණිය

01. (i) පන්සිය පනස් ජාතක පොතේ ඇතුළත් ජාතක කතා ගණන කොපමණ ද?

 (ii) ජාතක කතාවක ආකෘතික ලක්ෂණ මොනවා ද?

02. ''අද අසුවල් තෙන ලැගුම් ගන්නා හා අද වනාහී නුවරට එන්නාහ.''

 (i) ඉහත උද්ධෘතය කවරෙක් ප්‍රකාශ කරන්නක් ද?

 (ii) එය ශ්‍රවණය කළේ කවරෙක් ද?

03. (i) ගුත්තිල කතුවරයාගේ ගුරුවරයාගේ නම කුමක් ද?

 (ii) මූසිල කිනම් නුවරක වැසියෙක් ද?

04. (i) පන්සිය පනස් ජාතක පොත පරිවර්තනය සඳහා මූලාශ්‍රය කරගත් කෘතිය කුමක් ද?

 (ii) පන්සිය පනස් ජාතක පොත පරිවර්තනය නිසා දියුණු වූ සිංහල සාහිත්‍ය අංශ මොනවා ද?

05. (i) කාව්‍යශේඛරය හා කව්සිළුමිණ යන ග්‍රන්ථ සඳහා පදනම් වූ ජාතක කතා සඳහන් කරන්න.

 (ii) ධර්ම යුද්ධය සඳහා සහභාගි වූ දෙපාර්ශ්වය සඳහන් කරන්න.

06. (i) වේදේහ රජුට සිටි පඬිවරු තිදෙනෙකු නම් කරන්න.

 (ii) මහෞෂධ පඬිවරයාට දූත කාර්යයේ යෙදුනු කෙනෙකු නම් කරන්න.

07. (i) Village in the Jungle කෘතියෙහි කතුවරයාගේ මුල් ම රාජකාරිය ආරම්භ කළේ කොහෙන් ද?

 (ii) එතුමාගේ ලෝකඩ ස්මාරකය ඇත්තේ කොහේ ද?

08. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ නිර්මාණ අතුරින්,

 (i) ළමා නිර්මාණ දෙකක් නම් කරන්න.

 (ii) ජාතිකාභිමානී නිර්මාණයක් නම් කරන්න.

09. (i) ජන කවියට වස්තු විෂය වූ අවස්ථාවන් මොනවා ද?

(ii) විවිධ රැකියාවන් පදනම් කරගත් ජනකවි බිහි වූ බවට උදාහරණ ලියන්න.

10. ''මොකක් ද එයාගේ නම? කොහේ ද ගම?'' මෙම පාඨයට අනුව,

(i) එයාගේ නම කුමක් ද?

(ii) එයාගේ ගම කොහේ ද?

11. ''අපි දෙන්නමො ම පණ්ඩිතවරුම්හ''

(i) ඉහත සඳහන් පණ්ඩිතවරු දෙදෙනා කවුද?

(ii) එසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

12. (i) ගුත්තිල කාව්‍ය ලියවුණේ කුමන රජ කෙනෙකුගේ පාලන සමයේ ද?

(ii) ඒ සඳහා ආරාධනා කළ අගමැතිවරයා කවරෙක් ද?

13. ''මේ පණ්ඩිතයෝ මට මිණිරුවනක් ගෙනාවම්හ'' යි සිතා,

(i) මිණිරුවන හඳුන්වන සුවිශේෂී නම කුමක් ද?

(ii) මේ පණ්ඩිතයෝ යනුවෙන් අදහස් කරන තැනැත්තා කවුද?

14. (i) ජනකවියට අනුරාධපුර යුගය දක්වා දිවෙන ඉතිහාසයක් ඇති බවට කියවෙන කතා පුවත කුමක් ද?

(ii) ''හානා හීය පානා අඬහැරෙන් දනේ'' යන පද්‍ය සංග්‍රහය කුමන ජනකවි වර්ගයට අයත් ද?

15. පහත සඳහන් ග්‍රන්ථවල කතුවරුන් නම් කරන්න.

(i) The Monkey

(ii) නන්දන ගීත

16. (i) ගුත්තිල කාව්‍යයේ ආරම්භක පද්‍යය කිනම් ගණයකින් ලියවී ඇත් ද?

(ii) ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගණන කොපමණ ද?

17. (i) ජනකවිය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) ජනකවිවල උපත පිළිබඳ අනුරාධපුර යුගයේ ලියවුණු කෘතිය කුමක් ද?

18. ''මේ රජ්ජුරුවෝ මරණ හයින් හයපත්ව ගියාහ.''

(i) මෙසේ කීවේ කවුද?

(ii) මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.

19. ''තමන් ලැබූ දිවි පෙවෙතේ - කොටසක් රට සමය වෙතේ''

(i) මෙය උපුටා ගෙන ඇත්තේ කුමකින් ද?

(ii) එහි රචකයා කවරෙක් ද?

20. ''මේවායේ සෝෂාවයි කලබලයයි කරදරයි විතරයි''

(i) මෙහි මේවායේ යනුවෙන් අදහස් කරන්නේ කවර පරිසරයක් ද?

(ii) මෙසේ පැවසුවේ කාට ද?

02' (i) රැති වන පෙති නැවිදින් <u>සැමුවෝයා</u>
කිසි මියුරැති වෙණ නදළ මුවෝයා
සිතුවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් <u>සමුවෝයා</u>

(අ) ඉරි ඇඳි පද දෙකේ අර්ථය ලියන්න.

(ආ) මෙහි ඇති උපමාලංකාරයන් උපුටා ලියන්න.

(iii) සයින් මියැ තෙල මල කඩා හිස පැළඳ ගෙන ඇඹුල දඬු ගෙන බඩ පුරා කාපියව.

(iv)

(අ) ඉහත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) ''මහරජ දෙසේනාව සටන් නොකොට මැනව. රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙනා එක තැනකට එද්ද, ඉන් එක් කෙනෙක් වැන්ද වූ නම් වැඳි පක්ෂයේ රජ හට පරාජය වන්නේ ය.

(අ) මෙසේ වැඳීම නිසා ජය පරාජය තීරණය කිරීම හැඳින්වූයේ කෙසේ ද?

(ආ) මෙම පාඨය හා අවස්ථාව ලියන්න.

(v) ''රාළහාමි ඇත්තටම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද?''

(අ) ආරංචිය කුමක් ද?

(ආ) මෙසේ අසන්නේ කවුද?

(v) ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ.
..............................................
..............................................

(අ) ඉතිරි පද පේළි සම්පූර්ණ කරන්න.

(ආ) පද්‍ය පාඨයේ ඇති රූපක ලියන්න.

(vi) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තලා තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

(අ) ඉරි ඇඳි පදවල තේරුම ලියන්න.

(ආ) පද්‍යයේ ඇතුළත් ප්‍රස්තාව පිරුළ කුමක් ද?

(vii) දිය දිය ගොස පල කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය කඳ එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

(අ) අර්ථය ලියන්න.

I. දිය - .............................................. II. දිය ..............................................

(ආ) පද්‍යය ලිහිල් බසින් ලියන්න.

(viii) ''නොකඩ බලාපොරොත්තුව නිසා ඈ තුළ තිබුණු බිය ක්‍රමයෙන් තුනී වී යන්නට වන''

(අ) මෙහි ඈ යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?

(ආ) මෙහි සඳහන් නොකඩ බලාපොරොත්තුව කුමක් ද?

(ix) අසන රිසින් නයි කැළ ඔසළෝයා
ඔවුන වෙනම සිටිනා ගුරුළෝයා
වයන එවෙණ නද ලොබම කළෝයා
එදින වෛර සිත සිහි නොකළෝයා

(අ) කවියේ සඳහන් ආකාරයට වෛර කළෝ කවරහු ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(x) එමා සත්හු වෙණ නද අසමානය
සමා නොවෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය
.......................................................................

(අ) මෙහි අවසන් පද්‍ය පාඨය ලියන්න.

(ආ) උපමා කර ඇත්තේ කවුරුන් ද?

(xi) රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
මිණි බරණින් සැදි මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගහටත් හෙණ නොවදිද්ද

(අ) මෙහි සඳහන් සනාතන දහම කුමක් ද?

(ආ) උක්ත පද්‍යයේ මුල් පද දෙකේ අර්ථය කුමක් ද?

(xii) ''මේ ගම දූන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි. ළමයින් හා මහල්ලන් නැසී යන්නාක් මෙන් ගමත් දූන් නැසී යයි.''

(අ) මෙම ගමෙහි නම කුමක් ද?

(ආ) මෙම නිවසෙහි සිටි පුද්ගලයින්ට සිදු වූයේ කුමක් ද?

(xiii) ඉටුකොට කළ යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්

(අ) පුතා උතුම් වන්නේ කුමන කරුණක් නිසා ද?

(ආ) ගැරහුම් ලබන්නේ කුමන අවස්ථාවල දී ද?

(xiv) ''අපගේ මෙබඳු මන්ත්‍රණයට බාධා කළා වූ පසමිතුරා ගනුම් හ. එක් සියයක් රජ දරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා පිරිවරා ඒ මියුළු නුවරට යම් හ.''

(අ) මෙම පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල තේරුම ලියන්න.

(xv) ''මගේ මිනිහා එකේ ඇතුළෙ වෙන්න පුළුවනි.''

(අ) 'මගේ මිනිහා' යනු කවරෙක් ද?

(ආ) ඔහු එකේ ඇතුළට ගිය හේතුව කුමක් ද?

03 ' (i) ''මුනි සිරිපා සිඹිමින්නේ'' කවි පන්තිය තුළ දේශාභිමානී සහ ජාතිකාභිමානී හැඟීම් වර්ධනය කිරීමේ දී කවියා යොදාගෙන ඇති කාව්‍යමය උපක්‍රමය නිදසුන් තුනක්වත් ගෙන පැහැදිලි කරන්න.

(ii) උම්මග්ග ජාතකය කතා රසයෙන් අනූන වී ඇත්තේ ඉන් ජනිත කරන හාස්‍ය හා උපහාසය නිසා ය. නිර්දේශිත කොටසින් විමසන්න.

(iii) පුංචිමැණිකා ක්‍රමයෙන් අභාවයට යන්නේ ඒ ඒ කාලයට අනුවර්තනය නොවූ නිසා ය. යන්න බැද්දේගම නිර්දිෂ්ට කොටසින් පැහැදිලි කරන්න.

(vi) මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය සඳහා කවියා භාෂාව භාවිත කර ඇති අයුරු පිළිබඳ නිදසුන් සහිතව විස්තර කරන්න.

(vii) පුද්ගල වර්ධනය සඳහා දරුවන්ට කවර උපදෙස් මෙම පද්‍ය පංතියෙන් උකහාගත හැකි ය. යන්න මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියෙන් විස්තර කරන්න.

(viii) වැත්තෑවේ හිමි චිත්තරූප මැවෙන සේ පැදි පෙළ ඉදිරිපත් කොට ඇති අයුරු ගුත්තිල කාව්‍ය තුළින් විමසන්න.

(ix) ගුත්තිල කවියාගේ උපමා භාවිතයේ ඇති අපූර්වත්වය පිළිබඳ නියමිත පද්‍ය ආශ්‍රය කොටගෙන විමසීමක් කරන්න.

(x) පාණ්ඩිත්‍යය වෙනුවට සරල බව තම කවියෙහි ආත්මය බවට පත්කර ගැනීමට ගුත්තිල කවියා පෙළඹී ඇති අයුරු නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(xi) සරල කෘෂිකාර්මික ජීවන රටාවෙහි දී ඊට අවශ්‍ය වෘත්තීය සාර්ථකත්වය හා පවුල් ජීවිත සාර්ථකත්වය සඳහා ඉවහල් වන උපදේශ ජනකවියෙහි ඇත. අදාළ පාඩම ඇසුරින් උක්ත කියමන සනාථ කරන්න.

(xii) ජනකවියෙහි දකිය හැකි සුවිශේෂී ලක්ෂණ වූ සරල බස්වහර, උපදේශනාත්මක බව නියමිත පාඩම ඇසුරින් පැහැදිලි කරන්න.

(xi) උම්මග්ග ජාතකයෙහි සාර්ථකත්වයට කතුවරයාගේ සුදුසු උපමා භාවිතයත්, සංවාද මිශ්‍ර භාෂාවත් හේතු වී ඇත. නිදසුන් තුනක් යොදමින් විමසන්න.